# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල


| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1474 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 16/09/2024<br>පැය 2050 |

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පැරණි සිදුවීම් වලට අදාල වීඩියෝ දර්ශන නැවත සමාජ මාධ්‍ය ඔස්සේ සංසරණය වීම.**

දිවයිනේ විවිධ ප්‍රදේශවල, විවිධ කාලවලදී ඇතිවූ සිදුවීම් වලට අදාල වීඩියෝ දර්ශන සමාජ මාධ්‍ය ඔස්සේ මේ දිනවල විටින් විට සංසරණය වන අවස්ථා දැකිය හැකිය. උදාහරණ ලෙස කටුනායක ගුවන්තොටුපල දක්වා ගමන් කරන ඇතැම් වාහන විවිධ පුද්ගලයින් විසින් පරීක්ෂා කිරීම, ඇඳිරිනීතිය පනවන ලද අවස්ථාවලදී ලබා ගන්නා ලද වීඩියෝ දර්ශන පෙන්වා දිය හැකිය.

මෙවැනි වීඩියෝ දර්ශන මෙලෙස නැවත සමාජ මාධ්‍ය තුළ සංසරණය වීමෙන් වැරදි මතයක් සමාජ ගත වන අතර, පෙර සිදුවීම් වලට අදාල වීඩියෝ පට කාලීන සිදුවීම් ලෙස හුවා දක්වමින් සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කිරීම මහජනයා නොමග යැවීමකි. එය රට තුල නීතිය හා මහජන සාමය ආරක්ෂා කිරීමටද සෘජු ලෙස බාධා විය හැකි අතර, කරුණු නොදන්නා හෝ තහවුරු නොවූ මෙවැනි සංවේදී වීඩියෝ දර්ශන සමාජ මාධ්‍ය ජාලා තුල පල කිරීම හා බෙදා හැරීමෙන් වළකින ලෙසට පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටියි. ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි ආකාරයේ වීඩියෝ පට පල කරනු ලැබුවහොත් එවැනි අයට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කිරීමට සිදුවන බව අවධාරණය කරමි. මෙම මධ්‍ය නිවේදනය පිළිබඳව මහජනතාව දැනුවත් කරන ලෙස සියළු මාධ්‍ය ආයතනය වලින් කාරුණිකව ඉල්ලා සිටිමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**